**යටියන්තොට ප්‍රාදේශීය සභාව** **සභා වාර්තාව - 2023.02.14**

**ස්ථානය - යටියන්තොට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව** **දිනය - 2023.02.14** **වේලාව - පෙ.ව.9.00**

**සහභාගි වූ ගරු මහජන නියෝජිතයින්**

1.ගරු සභාපති - කේ.ඩී.වසන්ත මැතිතුමා 2.ගරු උප සභාපති - ඒ.වී.රොහාන්ත ගුණසේකර මැතිතුමා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී**

3. ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා
4. කේ.ජී.සුමනතිස්ස ජයතිලක මැතිතුමා
5 ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා
6. ආර්.එම්.එස්.ඩබ්ලිව්.රාජපක්ෂ බණ්ඩාර මැතිතුමා
7. ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා
8. ඩබ්ලිව් .කතිකා දමයන්ති මැතිනිය
9. කේ.කේ.නිමල් විජේසූරිය මැතිතුමා
10 .එන්.කේ.නිමල් කුමාරසිරි මැතිතුමා
11.ඩී.ඒ. සුනිල් දෙයියාගල මැතිතුමා
12.එම්.ඩබ්.හිමන්ත අජිත් බණ්ඩාර මැතිතුමා
13. ඩී.පී.ප්‍රේමසිරි ජයලත් මැතිතුමා
14.ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා
15.ඩබ්.ජී.සරත් ප්‍රේමසිරි මැතිතුමා
16.එස්.සුදර්ශන් මැතිතුමා
17.එච්.ඒ.දිල්සානි ප්‍රශාදිකා මැතිනිය
18.කේ.මධුෂිකා ප්‍රශාදිනි මැතිනිය.
19.එම්.ඩී.ඥානවති මැතිනිය
20.ටී.ඉමල්කා සංජීවනි මැතිනිය
21.බී.ජී.සීතා රංජනි මැතිනිය
22.ඒ.පී.ඩබ්ලිව්.එම්.පී ඩයනා උදයංගනි මැතිනිය
23.කේ.කමල්රාජ් මැතිතුමා

**සහභාගි වූ නිලධාරින්**

1.ලේකම් - දුමින්ද සී.වික්‍රමසිංහ මහතා 2.සංවර්ධන නිලධාරි ආර්.එච්.සී.නිශාන්ති සෙනවිරත්න මිය

**ගරු මහ සභාවට නොපැමිණි මන්ත්‍රිවරුන්ගේ නාම ලේඛනය**

01.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - එච්.කේ.ශාන්ත හෙට්ටිකන්ද මැතිතුමා
02.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි - ඒ.ජී.තිලකරත්න මැතිතුමා
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි - එච්.ඒ.ප්‍රියන්ත පුෂ්පකුමාර මැතිතුමා

ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැමිණි සිටි සියළුදෙනා ආගම සිහි කිරිමෙන් අනතුරුව ජාතික ගීය හා පළාත් පාලන ගීය ගායනයෙන් හා මියගිය රණවිරුවන් හට හා සභිකයින් ලෙස කටයුතු කර මිය ගිය මන්ත්රිතුමන්ලා හට ,කාර්යය මණ්ඩලයට ගෞරව කිරිමෙන් පසු සභාවේ කටයුතු පෙරවරු 9.00 ආරම්භ කරන ලදී.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

අද දින පැවැත්වෙන මහ සභා රැස්වීම සඳහා සහභාගි වි සිටින ගරු මන්ත්‍රිතුමන්ලා හා මන්ත්‍රිතුමියන්ලා ,කාර්යය මණ්ඩලය ගෞරවයෙන් සෙනෙහසින් යුතුව පිළිගනු ලබනවා. අද දින සභාව බාධාවකින් තොරව පවත්වාගන යාමට සහයෝගය අපේක්ෂා කරනවා.

**(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරිම**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

2023.01.10 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව මා විසින් ඔබ වෙත එවා ඇති අතර ඔබ සියළු දෙනා විසින් එය කියවූවා සේ සලකා එහි කිසියම් නිවැරදි කිරිම් හෝ සංශෝධන නොමැති නම් වාර්තා කර ඇති පරිදි ස්ථිර කරන ලෙසට හා නිවැරදි කිරිම් හෝ සංශෝධන ඇත්නම් එය සංශෝධනය කරන ලෙසත් සභාවට මා දන්වා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එස්.සුදර්ශන් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ගරු මහ සභාවට ඉදිරිපත් කරන ලද 2023.01.10 වන දින පැවැති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධන රහිතව සභා සම්මත කිරිමට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ජී.එම්.සත්‍යානන්දන් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

නිවරදි කිරිම් හෝ සංශෝධන රහිතව 2023.01.10 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත වූ බව ගරු මහ සභාවට නිවේදනය කර සිටිනවා.

**2.2023.01.27 වන දින විශේෂ මහ සභා වාර්තාව සම්මත කිරිම**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
2023.01.27 වන දින පැවති විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව මා විසින් ඔබ වෙත එවා ඇති අතර ඔබ සියළු දෙනා විසින් එය කියවූවා සේ සලකා එහි කිසියම් නිවැරදි කිරිම් හෝ සංශෝධන නොමැති නම් වාර්තා කර ඇති පරිදි ස්ථිර කරන ලෙසට හා නිවැරදි කිරිම් හෝ සංශෝධන ඇත්නම් එය සංශෝධනය කරන ලෙසත් සභාවට මා දන්වා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජේම්.සත්‍යානන්දන් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ගරු මහ සභාවට ඉදිරිපත් කරන ලද 2023.01.27 වන දින පැවැති විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධන රහිතව සභා සම්මත කිරිමට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
නිවරදි කිරිම් හෝ සංශොධන රහිතව 2023.01.27 වන දින පැවති විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත වූ බව ගරු මහ සභාවට නිවේදනය කර සිටිනවා.

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන-**
***. 2023.01.11 දින ජාතික විගණන කාර්යාලය විසින් 2021/2022 වසරට අදාල වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකිරිම සම්බන්ධයෙන් විගණන විමසුමක් එවා ඇත.එවා ඇති නාම ලේඛනය මේ සමඟ කාරුණිකව ඉදිරිපත් කරමි.**

***.යටියන්තොට ප්‍රාදේශිය සභාවේ 2022 භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ අනුව භාවිතයෙන් ඉවත් කරන ලද අබලි භාණ්ඩ වෙන්දේශිය 2023.03.01 වන දින පෙ.ව.10.00 ට යටියන්තොට ප්‍රාදේශීය සභා ඉදිරිපිට ගරාජ් භූමියේ සිදු කිරිමට කටයුතු කර ඇති බව නිවේදනය කරමි.**

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්,පැමිණිලි ඉදිරිපත් කිරිම**
**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත**

**(ඉ) කල් දී ඇති යෝජනා**

(ඉ) 01. අප සභාවේ සේවයේ නියුතු පහත සඳහන් මහත්ම මහත්මීන් විසින් ආපදා ණය මුදලක් ඉල්ලුම් කර ඇත. එම මුදල සභා අරමුදලින් ගෙවිම් කිරිම සඳහා මා යෝජනා කරනවා.
1.ආර්.කේ.ඩී.එස්.බණ්ඩාර මහතා - රු.40,000.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 01)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
(ඉ) 02. 2022 වර්ෂයේ ප්‍රාදේශීය සභා අරමුදල් ඉටු කරන ලද කර්මාන්තවල බිල්පත් වටිනාකම ණය හිමි ප්‍රතිපාදන යටතේ ගෙවිම් කිරිමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.
1.මත්තමගොඩ සුනිල් බේකරිය හරහා පරණ කොළණිය පාර සංවර්ධනය කිරිම - රු.150,000.00

**ගරු උප සභාපති ඒ.වී.රොහාන්ත ගුණසේකර මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 02)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

(ඉ) 03. 2000 අංක 53 සහ 1988 අංක 56 දරණ පනත් වලින් සංශෝධිත,1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතට අදාලව 2022.01.27 දිනැති අංක 2264/18 දරන ගැසට් නිවේදනයේ,කුඩා පරිමාණ දූෂකාරක,කර්මාන්ත / ක්‍රියාවලි සඳහා පාරිසරික ආරක්ෂක බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳ පළාත් පාලන ආයතන සඳහා මාර්ගෝපදේශ අංක 3.4.II අනුව පරිසර බලපත්‍ර /බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු සඳහා වෙනම මුදල් ශීර්ෂය හා වෙනම ගිණුමක් පවත්වාගෙන යා යුතු බව දන්වා ඇති බැවින් සභාපති ප්‍රාදේශීය සභාව යටියන්තොට (පරිසර) නමින් ලංකා බැංකුවේ ජංගම ගිණුමක් ආරම්භ කිරීම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා.

**ගරු උප සභාපති ඒ.වී.රොහාන්ත ගුණසේකර මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 03)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

(ඉ) 04. නාගරික සංවර්ධන අධිකාරිය විසින් බලය පවරන ලද කාර්යයන් ඉටු කිරීමේ දී මුදල් ගණුදෙනු ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ජංගම ගිණුමක විවෘත කළ යුතු බවට නාගරික සංවර්ධන අධිකාරිය විසින් 1987 සැප්තැම්බර් 30 දින අංක 08 හා 1993 මාර්තු 16 දින අංක 14 යන චක්‍රලේඛ ප්‍රකාරව මෙන්ම 2023.01.20 දින නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් එවන ලද ලිපිය මගින් ද දන්වා ඇත.ඒ අනුව සභාපති ප්‍රාදේශිය සභාව,යටියන්තොට (නාගරික සංවර්ධන) නමින් ජංගම ගිණුමක් ලංකා බැංකුවේ ආරම්භ කිරීම සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.සතයානන්දන් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා**

ගරු සභාපතිතුමනි,මාර්ග ටික නඩත්තුකර දැන්වීම් යොදා පිළිවෙළකට සකස් කරන්න කියලා මාර්ග සංවර්ධන අධිකාරියට ලිපියක් මගින් දැන්වීමක් කරන්න.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

ඉහත (ඉ) 04 යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් (ඉ) 04 යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 04)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

(ඉ) 05. 2023.01.27 වන දින විශේෂ සභාවට ඉදිරිපත් කළ අළුතින් ඉදි කිරීමට යෝජිත මාළු කඩය සඳහා ප්‍රතිපාදන සලසා ගැනීම වෙනුවෙන් 2023 අයවැය ලේඛනයේ 309 වැය ශීර්ෂයේ රු.2,500,000.00 ප්‍රතිපාදන 509 වැය ශිර්ෂයට මාරු කිරීමේ යෝජනාව නැවත පෙබරවාරි මහ සභාවට ඉදිරිපත් කර තීරණයක් ගැනීම සඳහා ගරු උප සභාපති ඒ.වී රොහාන්ත ගුණසේකර මැතිතුමා,ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.එස්.ජයතිලක මැතිතුමා,ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ලසික දෙයියාගල මැතිතුමා ,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ප්‍රේමසිරි ජයලත් මැතිතුමාගේ අත්සනින් යුතුව ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරමි.

*.(ඉ) 05 යෝජනාව මුද්‍රණ දෝෂයක් හේතුවෙන් ගරු උප සභාපති ඒ.වී.රොහාන්ත ගුණසේකර මැතිතුමා,ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.එස්.ජයතිලක මැතිතුමා,ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ලසික දෙයියාගල මැතිතුමා ලෙස වූ සඳහන ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.ජී.කේ.නිමල් විජේසූරිය මැතිතුමා,ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා,ගරු ප්‍රාදේශිය සභාව ඩබ්.ජී.සරත් ප්‍රේමසිරි මැතිතුමා ලෙස නිවරදි විය යුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, නිවරදි කිරීම් සහිතව ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 05)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

(ඉ).06. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය මගින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික ශිල්පීය පාඨශාලාව හදාරා කාර්යස්ථ පුහුණුවේ යෙදි සිටින මහවිල,යටියන්තොට ලිපිනයේ පදිංචි අයි.අමායා දේව්නි මෙනවිය හා පී.වි කෂ්මිකා දුලාංජලී මෙනවිය පෙබරවාරි මස සිට මාස 06 ක කාලයක් පුහුණු කටයුතුවල යොදවා ගැනීමටත් රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛ 04/2017 අනුව දෛනිකව රු.500.00ක දීමනාවක් සභා අරමුදලින් ගෙවීමටත් ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබා ගැනිමට යොමු කර ඇති බැවින් අනුමැතිය ලැබෙන තෙක් 2023 පෙබරවාරි මස සිට සභා අරමුදලින් ගෙවීම් කිරීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි කේ.නිමල් විජේසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 06)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

(ඉ) 07. මෙම සභාවේ සේවා ගිවිසුම් මත සේවයේ නියුතුව සිටින පහත සඳහන් අයගේ සේවා ගිවිසුම් කාලය අවසන් වේ. සේවා ගිවිසුම් කාලය වසරකින් දීර්ඝ කිරීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා මා යෝජනා කරනවා.

| අනු අංක | නම | තනතුර | සේවා ගිවිසුම් අවසන් වන දිනය |
|---|---|---|---|
| 01. | ඩබ්.ඒ.ඒ. ප්‍රභාත් කුමාර මයා | වැඩ ක්ෂේත්‍ර කම්කරු | 2023.02.16 |
| 02. | එස්. රංජන් මයා | සෞඛ්‍ය කම්කරු | 2023.03.09 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඩී.පී.ප්‍රේමසිරි ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 07)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

(ඉ) 08. 2022.11.22 දින ගරු මහා සභා තීරණ අංක 02 අනුව පත් කරනු ලබන භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් ඉදිරිපත් කර ඇති 2022.12.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ගරු මහා සභාව අනුමත කිරීමට හා එහි සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 08)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

(ඉ) 09. 2022.12.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් මිල කමිටුව සඳහා, පහත සඳහන් නිලධාරින් පත් කිරීමට ගරු මහා සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

- කාර්මික නිලධාරි, ඩබ්.ඒ.ජී.ඩී. කරුණාජීව මහතා
- කළමනාකරණ සේවා නිලධාරි, කේ.ඩී.එස්.ආර්. කුමාරි මිය
- ආදායම් පරීක්ෂක, කේ.එම්. ගුණතිලක මහතා

**ගරු ප්‍රාදේශීය සභා එස්.සුදර්ශන් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 09)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
(ඉ) 10. වීදි පහන් අලුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සපයා ගැනීමට අදාළව 2023.01.24 දිනැති ප්‍රසම්පාදන කමිටු තීරණය අනුව පහත සඳහන් පරිදි සපයා ගැනීමටත්, ඒ වෙනුවෙන් ගෙවීම් කිරීමටත් ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා.

| අනු අංකය | ද්‍රව්‍ය | ප්‍රමාණය | ඒකක මිල(රු) | මුළු මුදල (රු) | ආයතනයේ නම |
|---|---|---|---|---|---|
| 01 | 12.5W LED Bulb | 400 | 960.00 | 384,000.00 | D.M.ඉලෙක්ට්‍රිකල් |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එච්.ඒ.දිල්සානි ප්‍රසාදිකා මැතිනිය**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.මේක කළ යුතු කාර්යයක් මේ සඳහා ප්‍රමාණය වැඩි කරන්න.

**ගරු උප සභාපති ඒ.වී.රොහාන්ත ගුණසේකර මැතිතුමා**
ගරු සභාපතිතුමනි, වීථි ලාම්පු සවි කිරිමේ දී දැල්වෙන ප්‍රමාණය අඩුයි. ඒ පිළිබඳ සැළකිලිමත් වී ඒවා අධික්ෂණය කරලා අත්‍යවශ්‍ය ස්ථාන වලට පමණක් යොදනවා නම් හොඳයි
.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා**
ගරු සභාපතිතුමා වීථි ලාම්පු සවි කිරිමේ දි වසම් 32 අනුව සැලැස්මක් සකස් කරන්න.සැලැස්මට අනුව දින වෙන් කර වීථි පහන් ලබා දෙන්න.වීථි ලාම්පු 600 ක් ලබා ගනිමු.

**ගරු උප සභාපති ඒ.වී.රොහාන්ත ගුණසේකර මැතිතුමා**
ගරු සභාපතිතුමා ඉහත කාරණය පිළිබඳ කරුණු දැන ගැනිමට අවශ්‍යයි.සභාව කාරක සභාවක් බවට පත් කිරිමට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එස්.සුදර්ශන් මැතිතුමා**
ගරු සභාපතිතුමනි,ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

*.මහ සභාව පෙ.ව 11.10 කාරක සභාවක් බවට පත් විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, කාරක සභාව ගරු මහ සභාවක් බවට පත් කිරිමට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා**
ගරු සභාපතිතුමනි,ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

*කාරක සභාව පෙ.ව.11.20 ට පමණ මහ සභාවක් බවට පත් විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා**
ගරු සභාපතිතුමනි,විදුලි කාර්මික නිලධාරි මහතා විදුලි කාර්මික තනතුරට යොදවන්න පුළුවන්නම් හොඳයි.අළුත්වැඩියා කළාම ඒවා ඉක්මනින් අක්‍රිය වෙනවා. වසමට අත්‍යවශ්‍ය වීථි පහන් සඳහා බල්බ් 600 ක් ගනිමු.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත (ඉ) 10 යෝජනාව සඳහා වීථි පහන් 600 ක් ලබා ගැනිම සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් (ඉ) 10 යෝජනාව සඳහා වීථි පහන් 600 ක් ලබා ගැනිමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 10)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

(ඉ)11. යටියන්තොට ප්‍රාදේශීය සභාවට අයත් පහත වාහන රක්ෂණය අලුත් කිරීම කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට පහත මිල ගණන් සහා අරමුදලින් ගෙවීම් කිරීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

- RD 1663 දරන ට්‍රැක්ටරය = රු. 13,407.70
- RD 5111 දරන ට්‍රැක්ටරය = රු. 15,969.92

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 11)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

(ඉ) 12. යටියන්තොට ප්‍රාදේශීය සභාවට අයත් RD 4349 දරන ට්‍රැක්ටරය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් දායක මෝටර්ස් ආයතනයට රු. 40,800.00 ක බිල්පත් වටිනාකම ගෙවීම් කිරීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 12)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

(ඉ) 13. යටියන්තොට ප්‍රාදේශීය සභාවට අයත් RX 2003 දරන බවුසරය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් දායක මෝටර්ස් ආයතනයට රු. 80,685.00 ක බිල්පත් වටිනාකම ගෙවීම් කිරීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.නිමල් විජේසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 13)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

(ඉ) 14. යටියන්තොට ප්‍රාදේශීය සභාවට අයත් RD 4349 දරන ට්‍රැක්ටරය සේවා කිරීම වෙනුවෙන් නෙතුන් හෝල්ඩින් සර්විස් සෙන්ටර් වෙත රු. 20,180.00 ක බිල්පත් වටිනාකම ගෙවීම් කිරීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 14)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

(ඉ) 15. යටියන්තොට ප්‍රාදේශීය සභාවට අයත් RD 8015 දරන ට්‍රැක්ටරය සේවා කිරීම වෙනුවෙන් සී.එන්.එස්.සර්විස් සෙන්ටර් වෙත රු. 42,640.00 ක බිල්පත් වටිනාකම ගෙවීම් කිරීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 15)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

(ඉ) 16. යටියන්තොට ප්‍රාදේශීය සභාවට පැමිණෙන සේවා ලාභීන් හට ප්‍රයෝජනයට ගැනීම සඳහා වතුර පිල්ටරයක් සීමාසහිත ශ්‍රී ලංකා රජයේ විවිධ රජයේ වාණිජ ( විවිධ) නීතිගත සංස්ථාවෙන් සපයා ගැනීම වෙනුවෙන් රු.48,572.00ක බිල්පත් වටිනාකම ගෙවීම් කිරීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 16)**

**හදිසි යෝජනා**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ගරු ජී.එම්.නන්දසේන මැතිතුමා ඔබගේ යෝජනාව මේ මහ ගරු සභාවට ඉදිරිපත් කරන්න

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා**

**(ඉ) 17.** ගරු සභාපතිතුමනි**,** යටියන්තොට පොදු වෙළඳපල පිහිටි වැසිකිළි පද්ධතියේ ගලී ටැංකිය කඩා වැටී තියෙනවා.එය එම ස්ථානයට කරදරයක් ඒක අළුත්වැඩියා කරලා දෙන්න කියලා ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාවට අනුව යටියන්තොට පොදු වෙළඳපල පිහිටි වැසිකිළි පද්ධතියේ ගලී ටැංකිය අළුත්වැඩියා කිරීම ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 17)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

(ඉ) 18. යටියන්තොට ප්‍රාදේශීය සභාව සතු ජංගම අලෙවි කුටි බදු දීම සඳහා වූ ගිවිසුම් පත්‍රය ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 18)**

**(ඉ (ඊ) කාරක සභා වාර්තා සළකා බැලීම**
(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතු කළ ආදායම් පිළිබඳ මාසික වාර්තා
01 2023 ජනවාරි මාසයට අදාල වියදම් වාර්තාව
02. 2023 ජනවාරි මාසයට අදාල ආදායම් වියදම් වාර්තාව
03. 2023 ජනවාරි මාසයට අදාල ආදායම් ප්‍රගති වාර්තාව
04. 2023 ජනවාරි මාසයට අදාල අපේක්ෂිත සත්‍ය අදායම් හා වියදම් වාර්තාව

(ඌ) වෙනත් කරුණු
**01.නොපැමිණි ගරු මන්ත්‍රීතුමන්ලාගේ නිවාඩු අනුමත කිරීම**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශාන්ත කුමාර හෙට්ටිකන්ද මැතිතුමා සහ ඒ.ජී.තිලකරත්න මැතිතුමා අසනීප වීම නිසා අද දින සභාවට පැමිණීමට නොහැකි බව දන්වා සිටිනවා.එබැවින් අද දින නිවාඩු ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශාන්ත කුමාර හෙට්ටිකන්ද මැතිතුමා සහ ඒ.ජී.තිලකරත්න මැතිතුමා අසනීප වීම නිසා අද දින සභාවට පැමිණීමට නොහැකි බැවින් අද දින නිවාඩු අනුමත කරන බව ගරු මහ සභාවට මා දන්වා සිටිනවා.

**02.ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් දැක්වීම**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, පොදු සුසාන භූමිය සුද්ධ පවිත්‍ර කරලා දෙන්න කියලා මා ඉල්ලීමක් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා**

ගරු සභාපතිතුමනි, පන්සලේ වැඩමුළුවක් පැවැත්වූවා ඒ සඳහා ජල බවුසරය ලබා දීම පිළිබඳව මා ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම සභාපතිතුමා දඩාවතේ යන බල්ලන්ගේ ජනතාවට මහත් පීඩාවක් තියෙනවා.මේකට ඉක්මනින් විසඳුමක් ලබා දෙන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී ප්‍රේමසිරි ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ගල්පාත වීථි පහන් අළුත්වැඩියා කරන්න තියෙනවා.වීථි පහන් සඳහා සභාවේ වෙනම විදුලි අංශයක් පත් කරන්න.නිලධාරීන් පත් කරලා නඩත්තු කරනවානම් ගැටළු වෙනවා අඩුයි. ගල්පාත ආයුර්වේද වෛද්‍ය සායනය පැවැත්වීම සම්බන්ධයෙන් ඔබතුමා ඇතුළු කාර්යය මණ්ඩලයට ස්තුතිවන්ත වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.එස්.ඩබ්.රාජපක්ෂ බණ්ඩාර මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මත්තමගොඩ මාර්ගයේ කහ ඉරි සළකුණු කිරීම තවම ක්‍රියාත්මක වුයේ නෑ .ඒ පිළිබඳව මැදිහත් වෙලා කටයුතු කරන්න.

***සභාපතිතුමාගේ ස්තුති කථාව**
අද දින සභාවේ කටයුතු සාර්ථක කර ගැනිමට හැකි වීම පිළිබඳව ගරු මන්ත්‍රී මණ්ඩලයටත්, කාර්යය මණ්ඩලයටත් ගෞරවනීය ස්තුතිය පුද කරමින් මාධයය ආවරණය සඳහා පැමිණි මහතාටත් ස්තුතිය පුද කරමින් ප.ව 12.45 ට පමණ මහ සභා රැස්වීම අවසන් කරන ලදි.